Remove Watermark Now

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | රෝමානු කතෝලික | කාලය : පැය 3 |
|---|---|---|

නම : ..............................................................................................................

## 1 පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. ප්‍රඥා සාහිත්‍යයේ අඩංගු සාහිත්‍යමය ස්වරූපයට අදාළ නිවැරදි පිළිතුර වනුයේ,
 1) ගීත - සංකල්පනා - ස්ව නිර්මාණ - උපදේශ
 2) ප්‍රස්තාව පිරුළු ඉතිහාස කථා කතාන්දර - සංකල්පනා
 3) උපදේශ - නිර්මාණ - සටන් ගීත - ප්‍රේම ගීත
 4) ප්‍රස්තාව පිරුළු - උපදේශ - සංකල්පනා - ගීත

02. පුරාණ ගිවිසුමෙහි ඉතිහාස පොත් දේව වේදීය ඉතිහාස කථා ලෙස හඳුන්වන්නේ ඒවා තුළ
 1) මුල් මිනිස් ඉතිහාසය පිළිබඳ ව දක්වන බැවිනි.
 2) දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරී වීම දක්වන බැවිනි.
 3) ගැලවුම්කරුවාණන්ගේ පැමිණීම පිළිබඳ ව දක්වන බැවිනි.
 4) දේව ජනතාවගේ අත්දැකීම් හා බලාපොරොත්තු දක්වන බැවිනි.

03. ලේඛනගත වී නොමැති එහෙත් ජේසුස් වහන්සේ කළ කී බොහෝ දෑ ශුද්ධ වූ සභා මාතාව අපට ............ ඔස්සේ දානය කරන්නීය.
 1) ශුද්ධ බයිබලය 2) සංදේශ පත්‍ර 3) ජීවන සභා සම්ප්‍රදාය 4) විශ්ව ලේඛන

04. "අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා" යන ගෞරව නාමය ලැබුවේ,
 1) ශු. පාවුලු තුමාය. 2) ශු. පේදුරු තුමාය.
 3) ශු. ජොහාන් තුමාය. 4) ශු. පිලිප් තුමාය.

05. ජේසුස් වහන්සේ "ඔබ ඉතා භාග්‍යවන්තය" යනුවෙන් පැවසුවේ,
 1) ජාකොබ් තුමාටය. 2) පේදුරු තුමාටය. 3) ස්තේපන් තුමාටය. 4) පාවුලුතුමාටය.

06. ලන්දේසි පීඩන සමයේ ලංකාවේ කතෝලික දහම රැකගැනීමට දායක වූ ජුසේවාස් පියතුමා හා ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා අයත් ධර්මදූත නිකාය වනුයේ,
 1) ප්‍රැන්සිස්කාන 2) අගුස්තීන 3) දොමිනිකාන 4) ඔරතෝරියාන

07. ශුද්ධ වූ තෙරේසා මුනිවරිය විසින් ආරම්භ කරන ලද පැවිදි නිකාය
 1) "නිර්මල මරිය" පැවිදි නිකාය 2) "ලොරෙට්ටෝ" පැවිදි නිකාය
 3) "දයාවේ දූතිකාවන්ගේ" පැවිදි නිකාය 4) "අසරණ සරණ දූතිකාවන්ගේ" පැවිදි නිකාය

08. දෙවියන් වහන්සේගේ නාමයට මෙන් ම අන් අයගේ නාමයට ද ගරුකළ යුතු බව පෙන්වා දෙන දේව පණත වනුයේ,
 1) පළමුවන පණත 2) දෙවන පණත 3) තුන්වන පණත 4) හතරවන පණත

09. පේදුරුතුමාගේ මහා ප්‍රකාශනය නම්
 1) "ඔබ දෙවියන්ගේ පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ප්‍රසන්න වෙමි."
 2) "ඔබ දෙවියන්ගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේය."
 3) "ඔබ ක්‍රිස්තුවරයාණෝය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය."
 4) "ඔබ දෙවියන් වහන්සේගේ ආශිර්වාදිතයාණෝය."

10. නව ගිවිසුමට අයත් පාවුලු සංදේශ ගණන
 1) 06 කි. 2) 07 කි. 3) 12 කි. 4) 13 කි.

papers.lk
pdfelement

Remove Watermark Now

11. මහා බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදූ බව දක්වන ශුභාරංචිය වනුයේ,
1) මාර්ක් ශුභාරංචිය  2) මතෙව් ශුභාරංචිය  3) ලූක් ශුභාරංචිය  4) ජොහාන් ශුභාරංචිය

12. ඉරුදින අපගේ ප්‍රධාන ණය යුතුකම වන්නේ,
1) නිවාඩු දිනයක් ලෙස ගත කිරීම.  2) දිව්‍ය පූජාවට සහභාගී වීම.
3) යහපත් ක්‍රියාවන් හි නිරත වීම.  4) තම යුතුකම් නිසිලෙස ඉටු කිරීම.

13. නුඹේ පියාට ද මවට ද ගෞරව කරව. එවිට නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ ..............................
1) බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය.  2) සැප සම්පත් භුක්ති විඳින්නෙහිය.
3) බොහෝ දරු සම්පත් ලබන්නෙහිය.  4) ආසිරි පැතිමේ නාමයක් වන්නේහිය.

14. සෑම මිනිස් ජීවිතයකටම ගරු කළ යුත්තේ සෑමදෙනාම
1) දේව සමානකම දරණ බැවිනි.  2) දෙවියන්ට පක්ෂපාතී දරුවන් බැවිනි.
3) දේව නියමයන් රක්ෂා කරන බැවිනි.  4) එකම ඉරණමකට කැඳවා ඇති බැවිනි.

15. "නුඹේ සහෝදරයාගේ ලේ පොළවෙන් මට මොර ගසයි. මින් මතු නුඹ පොළෝ තලය මත සාපලද්දෙක් වේවා" යි දේව දඬුවමට පාත්‍ර වූ පුද්ගලයා
1) නෝවා  2) ඒසව්  3) කායින්  4) ජාකොබ්

16. 6 හා 9 වන පණතට විරුද්ධ ක්‍රියාවකි,
1) අන් අයගේ හොඳ නම කෙලසීම.  2) අසභ්‍ය වචන භාවිතා කිරීම.
3) මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම.  4) සියදිවි හානි කර ගැනීම.

17. ලබන වැටුපට සරිලන සේවයක් ඉටු නොකරන්නා ...................... පණතට විරුද්ධව පව් කරන්නේය.
1) පස්වන  2) හයවන  3) හත්වන  4) අටවන

18. පැරණි ගිවිසුමේ සියලුම යාග .......................... මගින් පූර්ණත්වයට පත්විය.
1) කල්වාරි යාගය  2) සීනයි ගිවිසුම  3) දවන පූජා  4) බිලි පූජා

19. මාර්ක් ශුභාරංචිය සඳහා භාවිතා වන වෙනත් නාමයකි.
1) කාන්තාවන්ගේ ශුභාරංචිය  2) දේව දයාවේ ශුභාරංචිය
3) දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය  4) ගැලවීමේ ශුභාරංචිය

20. ස්නාවක ජොහාන් තුමා තම දූත මෙහෙවර සඳහා තෝරා ගත්තේ,
1) ජෝර්දාන් ගඟ අසලය.  2) ජෙරුසලම් දේව මාලිගය අසලය.
3) ගලීල මුහුද අසලය.  4) මල් උයන අසලය.

21. ශුද්ධවූ සභාව ආරම්භ වූයේ පෙන්තකොස්ත දින .................................. ය.
1) අන්තියෝකයෙහි  2) ජෙරුසලමෙහි  3) එපීසියෙහි  4) බෙත්ලෙහෙමෙහි

22. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා
1) පේදුරුතුමාය.  2) ස්නාවක ජොහාන් තුමාය.  3) ජාකොබ් තුමාය.  4) ස්තේපන් තුමාය.

23. පුද්ගලයන් කොන් කිරීම, ඇනුම්පද කීම, බොරු නඩු වලට පටලැවීම හා පරිසරය දූෂණය කිරීම වැනි ක්‍රියා ...................... විරුද්ධ ක්‍රියා වේ.
1) තුන්වන පණතට  2) හතරවන පණතට  3) පස්වන පණතට  4) හයවන පණතට

24. ශුද්ධාත්මයාණන් රැවටීම හේතුකොට ගෙන මරණයට පත් වූ මුල් කිතුනු සභාවේ යුවළ
1) ජොහාන් හා සැලෝමී  2) සකරියස් හා එළිසබෙත්
3) අනනියස් හා සපීරා  4) සෙබදි හා ජොවන්නා

25. ජනවන්දනා වසර ආරම්භ වනුයේ,
1) ආගමන සමයෙහි  2) නත්තල් සමයෙහි  3) චතාරික සමයෙහි  4) පාස්කු සමයෙහි

26. ආශිර්වාදකාර බන්ධනය ප්‍රසාද නිධානයේ බාහිර සලකුණ වනුයේ,
1) මුදු පැළඳවීම  2) පියතුමාගේ ආශිර්වාදය  3) අත්සන් තැබීම.  4) විවාහ පොරොන්දුව

27. නව මැවිල්ලේ ආරම්භකයා ලෙස සලකනු ලබන්නේ,
1) ඒව  2) නෝවා  3) ආබ්‍රහම්  4) ජෝශප්

papers.lk
pdfelement

28. දෙවියන් වහන්සේ නෝවා සමඟ ඇතිකර ගත් ගිවිසුමෙහි බාහිර සලකුණ වන්නේ,
1) දේදුන්න 2) වළාකුල 3) චර්මච්ඡේදනය 4) ගිනිටැඹ

29. මොහු ස්වාමීන් වහන්සේ අභිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේය. ඔහු මිදියුෂවත් මත්පැන්වත් නොබොන්නේය. මව්කුස සිටම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේය. මෙම ප්‍රකාශනයට අදාළ වන්නේ,
1) පාවුලු තුමාය. 2) ස්නාවක ජොහාන් තුමාය.
3) ජේසුස් වහන්සේය. 4) පිලිප් තුමාය.

30. දෙවියන් වහන්සේ මිසර වාසීන් මත එවන ලද පළමු හා අවසාන වසංගතය වූයේ,
1) මැඩි උවදුර හා ගනඳුර උවදුර 2) ලේ වතුර වීම හා මැසි උවදුර
3) මැසි උවදුර හා ගව සම්පත් වැනසීම 4) වතුර ලේ බවට පත්වීම හා කුළුඳුලන්ගේ මරණය

31. ස්නාවක ජොහාන් තුමාගේ ජීවිතය තුලින් අපට ලැබෙන ප්‍රධාන මඟපෙන්වීම වනුයේ,
1) යුක්තිගරුක වීම හා සාධාරණ වීම. 2) අවංකබව හා සත්‍යවාදී වීම.
3) සාමකාමී වීම හා දයාවන්ත වීම. 4) පරිත්‍යාගී වීම හා සේවය කිරීම.

32. ඉශ්රායෙල් ජනතාව සුවිශේෂ දේව ජනතාවක් බවට පත්වූයේ,
1) පොරොන්දු දේශයට පැමිණීමෙන් පසුවය. 2) රතු මුහුද තරණයෙන් පසුවය.
3) සිනයි ගිවිසුමට බැඳීමෙන් පසුවය. 4) චර්මච්ඡේදනය ලැබීමෙන් පසුවය.

33. රාජ්‍ය පාලකයන්ගේ-පුරවැසියන්ගේ යුතුකම් හා වගකීම් පිළිබඳ ව අපගේ අවධානය යොමු කරන්නේ,
1) හතරවන පණතයි. 2) පස්වන පණතයි.
3) හත්වන පණතයි. 4) දහවන පණතයි.

34. බුත්තල "සුබසෙත් සෙවණ" නම් වාසස්ථානය කර ගනිමින් බදුල්ල පළාතේ වතු කම්කරුවන් සඳහා හඬක් නගමින් දිළිඳු ජනතාවට සේවය කළ මෙතුමා දිව්‍ය පූජාව සිදු කරමින් සිටියදී වෙඩි පහරින් ජීවිතක්ෂයට පත් වූ මෙතුමා
1) මැක්සිමිලියන් කෝල්බේ පියතුමා 2) දොන් පීටර් පිල්ලේ පියතුමා
3) ජුවාම් විලාද කොන්දේ පියතුමා 4) මයිකල් රුද්‍රිගු පියතුමා

35. තමාට ලැබී ඇති ධනය පරිහරණය කළ යුත්තේ,
1) තමන්ගේ හා පවුලේ අයගේ දියුණුව සඳහාය.
2) මෙලොව ජීවිතය සුවයෙන් හා සතුටින් ගත කිරීම සඳහාය.
3) සමාජීය හා ආගමික අවශ්‍යතාවයන් සඳහාය.
4) තමාගේ මෙන් ම අන් අයගේ ද යහපත සඳහාය.

36. ................................ දෙදෙනෙකු අතර සිදුවන විවාහ ගිවිසුම දේව ප්‍රසාද නිධානයක් වන්නේය.
1) ප්‍රසාද ස්නාපනය ලැබූ 2) විශ්වාසවන්ත වන්නාවූ
3) අන්‍යෝන්‍ය ප්‍රේමය දිනාගත් 4) දේව ආශිර්වාදය ලබාගත්

37. පූජකවරයේ පූර්ණත්වය හිමි වන්නේ,
1) අනුනායක හිමිපාණන්ටය. 2) රාජගුරු ප්‍රසාදිතුමාටය.
3) ශුද්ධෝත්තම පියතුමාටය. 4) තේවාචාර්ය තුමාටය.

38. ශ්‍රී ලාංකීය කිතුනු සාහිත්‍යයේ නිර්මාතෘ වන්නේ,
1) මර්සලින් ජයකොඩි පියතුමා 2) දොන් පීටර් පියතුමා
3) ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා 4) ජුසේවාස් පියතුමා

39. ශුද්ධ වූ පාවුළුතුමාට උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ හමුවූයේ .................. බලා යමින් සිටියදීය.
1) ජෙරුසලම 2) සමාරිය 3) දමස්කය 4) අන්තියෝකය

40. ශුද්ධ වූ ත්‍රිත්වය ලොවට ප්‍රකාශ වූ අවස්ථාවකි ජේසුස් වහන්සේගේ,
1) ස්වර්ගාරෝහණ අවස්ථාවේ දී 2) දුක් ප්‍රාප්තිය තුළ දී
3) උත්ථාන වූ අවස්ථාවේ දී 4) බෞතීස්ම ස්නාපනයේ දී

Remove Watermark Now

# II පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) 1. ද්විතීය පාවුලු සංදේශ දක්වන්න.
2. බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.
3. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක දක්වන්න.
4. ජනවන්දනා වසරට අයත් මනස්ථාපනයේ කාල දෙක දක්වන්න.
5. ස්නාවක ජොහාන් තුමාගේ දේශනය යොමු වූ ජන කණ්ඩායම් දෙකක් දක්වන්න.
6. සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
7. පදවි පූජකවරුන් බැඳෙන පොරොන්දු දෙක ලියන්න.
8. කිතුනු විවාහයේ ලක්ෂණ දෙක දක්වන්න.
9. පැවිදි නිකායයන් බෙදා දැක්විය හැකි කොටස් දෙක දක්වන්න.
10. දෙවියන් වහන්සේ හා ගිවිසුමෙන් බැඳුනු පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

02) 1. දිවැසිවරයා යන්න හෙබ්‍රෙව් වදන දක්වා එහි තේරුම ලියන්න.
2. දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ තුනක් ලියන්න.
3. දේව වචනයට සාක්ෂිකරුවකු වීමට ඔබට කළ හැකි ක්‍රියා පහක් ලියන්න.

03) 1. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වූ සලකුණු දෙකක් ලියන්න.
2. ශුද්ධාත්මයාණන් හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න.
3. අභිවෘද්ධි ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම් පහක් ලියන්න.

04) 1. පැරණි ගිවිසුමට අයත් ජනප්‍රිය ඉතිහාස පොත් දෙක නම් කරන්න.
2. වෘත්තීමය වශයෙන් රහස් රැකීමට බැඳී සිටින පුද්ගල කණ්ඩායම් තුනක් දක්වන්න.
3. පංච පුස්තකයට අයත් ග්‍රන්ථ නම් කරන්න.

05) 1. කතෝලික විවාහයට ඇති නිත්‍යානුකූල බාධා දෙකක් ලියන්න.
2. විවාහ පොරොන්දුවේ ප්‍රධාන කරුණු තුන ලියන්න.
3. ඔබගේ නිවස / පවුල යහපත් කරලීමට දායක විය හැකි ක්‍රම පහක් ලියන්න.

06) 1. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.
2. දසපණතෙහි අඩංගු දෙවියන් වහන්සේ කෙරෙහි යුතුකම් තුනක් ලියන්න.
3. දසපණතෙහි අඩංගු සාරධර්ම පහක් ලියන්න.

07) 1. මතෙව් ශුභාරංචිය සඳහා භාවිත කරන වෙනත් නම් දෙකක් ලියන්න.
2. නොදවන පූජාවන් සඳහා භාවිත කළ ද්‍රව්‍ය තුනක් ලියන්න.
3. ඔබ එදිනෙදා ජීවිතය තුළ කල්වාරි යාගයට සම්බන්ධ විය හැකි ක්‍රම පහක් දක්වන්න.

papers.lk
pdfelement